# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1928/23 - 2015 අගෝස්තු මස 21 වැනි සිකුරාදා - 2015.08.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 21/78 (xiv)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

20(4) වන වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 20 වන වගන්තියේ (4) වන උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන සහ පර්යේෂණ අමාත්‍ය සරත් අමුණුගම වන මා විසින්, ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ පරිපාලන කටයුතු බරපතල ලෙස අවුල් වී ඇති බවට සහ එම විද්‍යායතනයේ බලධාරීන් විසින් එම විද්‍යායතනයේ කටයුතු යථා තත්ත්වයට ගෙන ඒමට අපොහොසත් ව ඇති බවට ද සෑහීමකට පත් වීමෙන් පසු එකී පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද නියමයක්, නියමාවලියක්, ප්‍රඥප්තියක්, අතුරු ව්‍යවස්ථාවක්, නියෝගයක් හෝ රීතියක් යටතේ ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ අධ්‍යක්ෂක වෙත පිරිනමන ලද, පනවන ලද හෝ පවරන ලද පිළිවෙලින් යම් බලතල, කාර්යය හෝ කර්තව්‍යය ක්‍රියාත්මක කිරීමේ, ඉටු කිරීමේ හෝ කිරීමේ කාර්යය සඳහා එකී අධ්‍යක්ෂක වෙනුවට නිසි බලධරයා වශයෙන් මහාචාර්ය ජයන්ත වැලිහිඳ, 2015 අගෝස්තු මස 25 වන දින සිට බලපැවැත්වෙන පරිදි මෙම නියමය මගින් පත් කරමි.

සරත් අමුණුගම,
උසස් අධ්‍යාපන සහ පර්යේෂණ අමාත්‍ය.

2015 අගෝස්තු මස 14 වැනි දින,
කොළඹ දී ය.

09-89


1A - PG 2583 — 507 (2015/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*